057522
ML/PR
2019/07/27

# රයිගම් කෝරළයේ මඩු ශාන්තිකර්ම සහ කුල ක්‍රමය

එම්. තුෂාරි දමයන්ති
DD/MP/DA/08/031
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

ප්‍රාසංගික කලා ශාස්ත්‍රපති ද්‍රෑ අවුරුදු උපාධි පාඨමාලාව

2018 පෙබරවාරි

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

057522

# සංක්ෂිප්තය

රයිගම් කෝරළයේ මඩු ශාන්තිකර්ම පූජෝත්සවය හා කුල ක්‍රමය අතර පවතින්නා වූ සම්බන්ධතාව කුමන ආකාරයකින් පවතින්නේ ද පිළිබඳ කරනු ලැබූ අධ්‍යයනයේ දී ඒ හා සම්බන්ධ විවිධ මූලාශ්‍රය හැදෑරීම අත්‍යවශ්‍ය විය. උක්ත මාතෘකාව හා යෙදෙන ප්‍රාථමික මූලාශ්‍රය, ද්විතීය මූලාශ්‍රය සහ මේ සම්බන්ධයෙන් සිදු වී ඇති පර්යේෂණ පිළිබඳ ව ඇති ලිඛිත තොරතුරු ආශ්‍රය කිරීමට දරන ලද උත්සාහය පළමු පරිච්ඡේදයෙන් දක්වේ.

ගම්මඩු ශාන්තිකර්ම පූජෝත්සවය හඳුනා ගැනීම සහ ගම්මඩු ශාන්තිකර්ම පූජෝත්සවවල ඓතිහාසික පසුබිම අධ්‍යයනය කිරීම දෙවන පරිච්ඡේදයේ දී සිදු කරන ලදී. එහි දී ශාන්තිකර්මවල ආරම්භය සහ පැතිරීම පිළිබඳ කරුණු අධ්‍යයනයක නිරත විය. එසේ ම රයිගම් කොරළයේ මඩු ශාන්තිකර්ම සඳහා සහභාගී වන කපු පත්තිනි පරම්පරාවන් පිළිබඳ මෙම අධ්‍යයනයේ දී හඳුනාගත් තොරතුරු ද දෙවන පරිච්ඡේදයේ ඇතුළත් කර ඇත. විශේෂයෙන් ම රයිගම් කෝරළයේ ගම්මඩු සම්බන්ධ ඓතිහාසික ගුරු පරම්පරාවන් සහ වර්තමානයේ ගම්මඩු ශාන්තිකර්මවලට සම්බන්ධ වන නූතන කපු පරම්පරාවන් පිළිබඳ තොරතුරු ඇතුළත් කර ඇත.

රයිගම් කෝරළය මඩු ශාන්තිකර්ම පූජෝත්සවය හා කපු පත්තිනි ගුරු පරම්පරාවන් පිළිබඳ කරනු ලබන අධ්‍යයනයට රයිගම් කෝරළයේ භෞතික සහ ඓතිහාසික මෙන් ම සංස්කෘතික වශයෙන් පවතින තොරතුරු කුමන ආකාරයකින් පවතින්නේ ද පිළිබඳ ව තොරතුරු තුන්වන පරිච්ඡේදයේ ඇතුළත් වේ. එසේ ම රයිගම් කෝරළයේ මඩු ශාන්තිකර්ම සමාජය සහ කුල ක්‍රම සමග බද්ධ වී පවතින ආකාරය පිළිබඳ ව හෙළි කර ගත හැකි වූ තොරතුරු සහ රයිගම් කෝරළයේ මඩු ශාන්තිකර්මවල වර්තමානයේ පවතින විශේෂිත ලක්ෂණ හා පූර්වගාමී ව පැවති මඩු ශාන්තිකර්මවල ලක්ෂණ සමග සැසඳීමක් අන්තර්ගත වී ඇත.

ශ්‍රී ලංකාවේ කුල සාධකයෙහි ඓතිහාසික පසුබිම සහ කුල ක්‍රමය හඳුනාගැනීම මෙන් ම කුල ක්‍රමයේ පැතිරීම පිළිබඳ ව අධ්‍යයනයේ දී ලබාගත් තොරතුරු සිව්වැනි පරිච්ඡේයේ ඇතුළත් වේ. කුලය නැමැති සාධකය හා සම්බන්ධ වී පවතින සමාජමය පසුබිම එහි අතීත ස්වරූපය සහ කුලය නැමැති සාධකයෙහි වර්තමාන ස්වරූපය පිළිබඳ ව විමර්ශනය කරගත් තොරතුරු ද පරිච්ඡේදයෙහි අන්තර්ගත වී ඇත.

රයිගම් කෝරළයේ මඩු ශාන්තිකර්ම සහ කුල ක්‍රමය පිළිබඳ ව කරනු ලැබූ අධ්‍යයනයේ දී ග්‍රන්ථ පරිශීලනය මඟින් කර ඇති සමීක්ෂණ සහ නිරීක්ෂණ අධ්‍යයනය කිරීමෙන් ඓතිහාසික මූලාශ්‍රය සහ තොරතුරු පරිශීලනය කිරීමෙන් සහ තෝරාගත් සම්පත්ලාභීන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙන් ඔවුන් ගෙන් ලබාගත් තොරතුරු සාරාංශ කර නිගමනවලට එළඹීමට හැකි විය. පර්යේෂණයේ දී මා විසින් සොයාගත් සාධක, විමර්ශනය කරමින් නිගමනවලට එළඹී ආකාරය මෙම පරිච්ඡේදය තුළ සම්පිණ්ඩනය වී ඇත.